# මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන
# ඩිප්ලෝමා වැඩසටහන
# 2017 / 2018

ශ්‍රී ලංකා විවෘත
විශ්වවිද්‍යාලය



මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන
දෙපාර්තමේන්තුව
අධ්‍යාපන පීඨය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

# මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා
# වැඩසටහන පිළිබඳ
# තොරතුරු ඇතුළත් පොත

## 2017 / 2018

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

තැ. පෙ. 21, නාවල, නුගේගොඩ

| | | |
|---|---|---|
| දුරකථන | : | **011-2881327 / 256 / 482 / 078** |
| **E-mail** | : | **Postmast@eductn.ou.ac.lk** |
| **Web** | : | **www.ou.ac.lk** |

**දයාබර සිසු / සිසුවිය,**

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය** මහජන අවශ්‍යතාවලට සරිලන පරිදි රටෙහි සංවර්ධනය උදෙසා පුහුණු ශ්‍රමය සපයන, පුද්ගල සංවර්ධනයට ආධාර වන ආයතනයකි.

මෙම ආයතනය දුරස්ථ අධ්‍යාපන ක්‍රමය තුළින් ඉගැන්වීමේ වැඩසටහන් දියත් කරයි. මූලික අධ්‍යාපන අවස්ථා නොලද, අතරමඟදී අධ්‍යාපන කටයුතුවලින් ඉවත් වූ, එමෙන්ම තවදුරටත් අධ්‍යාපන අවස්ථා උදාකර ගැනීමට වෙහෙසෙන අයට විශේෂයෙන් යොමු වන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අධ්‍යාපන වැඩසටහන් සකස් කර ඇත.

ඉගෙනීමට තම සම්පූර්ණ කාලය මිඩංගු කිරීමට අපහසු සිසුනට වයස් සීමාවකින් තොරව අධ්‍යයන කටයුතු කිරීමට මෙම ආයතනය පහසුකම් සලසා ඇත. තම සුදුසුකම් අනුව තමා කැමති වැඩසටහනක් තෝරා ගත හැකිය.

සිසුන් හට තම කැප කිරීම තුළින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අත දීමට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය සෑම විටම කැප වී සිටී.

# අන්තර්ගතය

## පළමු කොටස - සාමාන්‍ය තොරතුරු


**1. හැඳින්වීම**

**2. අධ්‍යයන පද්ධතිය**

2.1 මුද්‍රිත ඉගෙනුම් ද්‍රව්‍ය

2.2 දින පාසල්, සාකච්ඡා පන්ති, උපදේශන සැසි, නිබන්ධන පන්ති, වැඩමුළු

2.3 ඇගැයීම

**3. ප්‍රාදේශීය මධ්‍යස්ථාන සේවා**

3.1 ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

**4. අධ්‍යාපන පීඨය**

**4.1 මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

4.1.1 මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවන අධ්‍යයන වැඩසටහන්

## දෙවන කොටස

# 5. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන හා අදාළ තොරතුරු


5.1 වැඩසටහනෙහි පරමාර්ථ
5.2 ප්‍රවේශ සුදුසුකම්
5.3 අධ්‍යයන මාධ්‍ය
5.4 ප්‍රාදේශිය මධ්‍යස්ථාන
5.5 අධ්‍යයන පිළිවෙල
5.6 අධ්‍යයන වැඩසටහනේ විෂය මාලාව
5.7 පූර්ව අවශ්‍යතා
5.8 පාඨමාලාවලින් නිදහස් කිරීම
5.9 ඇගයීම් ක්‍රියාවලිය
5.10 සහතික ප්‍රදානය
5.11 ලියාපදිංචිය සහ ගෙවීම්
5.12 ගාස්තු
5.13 වැඩසටහන ආරම්භය

**6 MY OUSL**

**7 අයදුම්පත් සහ ලියාපදිංචිය**

**ඇමුණුම 1- ONLINE අයදුම්පත් පිරවීම සඳහා උපදෙස්**

## පළමු කොටස - සාමාන්‍ය තොරතුරු

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතට අනුව 1980 දී පිහිටුවන ලදි. ඒ හේතුවෙන් මෙම විශ්වවිද්‍යාලයට ජාතික විශ්වවිද්‍යාලයකට සමාන වූ නීතිමය හා ශාස්ත්‍රීය තත්ත්වයක් ඇත. එය වෙනත් විශ්වවිද්‍යාලවලට වඩා වෙනස් වනුයේ වැඩසටහන් දියත් කිරීම සඳහා දුරස්ථ අධ්‍යාපන මාධ්‍යය යොදා ගන්නා බැවිනි.

වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම අයෙකුට තමනට තිබෙන ඉඩ පහසුකම් හා කාලය අනුව තමා කැමති ස්ථානයක සිට **සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි** වැඩසටහන් හදාරා, එහි සාර්ථකත්වය නිසි අයුරින් අත්කර ගැනීමට හැකි වන පරිදි අධ්‍යයන වැඩසටහන් සැලසුම් කර ඇත.

දුරස්ථ මාධ්‍යයෙන් අධ්‍යයන වැඩසටහන් සම්පාදනය කරන ශ්‍රී ලංකාවේ එකම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වේ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අංශ, පීඨ පහක් යටතේ පිහිටුවා ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ.

1. අධ්‍යාපන පීඨය
2. මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
3. ස්වභාවික විද්‍යා පීඨය
4. ඉංජිනේරු සහ තාක්ෂණ විද්‍යා පීඨය
5. සෞඛ්‍ය විද්‍යා පීඨය

මෙම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන මණ්ඩපය සහ කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථානය නාවල පිහිටා ඇත. එමෙන්ම ප්‍රාදේශීය මධ්‍යස්ථාන, අධ්‍යයන මධ්‍යස්ථාන, ඉගැන්වීමේ මධ්‍යස්ථාන විශාල සංඛ්‍යාවක් දිවයින පුරා විසිරී ඇත.

## 2. අධ්‍යයන පද්ධතිය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් ක්‍රමය, බහු මාධ්‍ය මත පදනම් වී ඇත.

### 2.1 මුද්‍රිත ඉගෙනුම් ද්‍රව්‍ය

දූරස්ථ අධ්‍යාපන ක්‍රමයේ මූලික අංගයක් වන මුද්‍රිත ඉගෙනුම් ද්‍රව්‍ය මෙම වැඩසටහන්වල ප්‍රධාන ඉගෙනුම් මාධ්‍යය වේ.

මේවා උපයෝගී කර ගෙන ශිෂ්‍යයාට කරුණු විශ්ලේෂණය තුළින් අවබෝධ කර ගැනීමට පහසුවක් සැලසේ. ශිෂ්‍යයාගේ විශ්ලේෂණ ශක්‍යතාව හා චින්තන ශක්තිය ද වර්ධනය කර ගැනීමට මුද්‍රිත ද්‍රව්‍ය උපකාරී වේ. මේ තුළින් සිසුන්ට ගුරු කේන්ද්‍රීය බවින් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමයෙන් ස්වයං පෙළඹවීමක් මත තම අධ්‍යයන කටයුතු කර ගෙන යා හැකිය. මුද්‍රිත පාඩම් සම්පාදනයේ දී ශිෂ්‍යයාට ස්වයං ඇගයීමක් කිරීමට උපකාරී වන ප්‍රශ්න සහ ක්‍රියාකාරකම් කිහිපයක් ද ඇතුළත් කොට ඇත.

## 2.2 දින පාසල් / සාකච්ඡා පන්ති / උපදේශන සැසි / නිබන්ධන පන්ත / වැඩමුළු

ස්වයං අධ්‍යයන සඳහා වෙනත් ඉගෙනුම් උපකාරක සැලසුම් කොට ඇතත්, ඒවායේ අඩංගු විෂය කරුණු පිළිබඳ ව සිසුන් තුළ දුරාවබෝධයක් ඇතොත්, එම ගැටළු සාකච්ඡා කිරීමට විධිමත් පිළිවෙලකට දින පාසල්, නිබන්ධන පන්ති, වැඩමුළු ආදිය පැවැත්වේ.

සෑම විටම සිසුන්හට තම පාඨමාලාව සාර්ථක ව නිම කර ගැනීමට සහය වීම පිණිස මෙවැනි විධිමත් වැඩපිළිවෙලක් තුළින් අධ්‍යයන කාර්ය මණ්ඩලය උපකාරී වේ.

## 2.3 ඇගයීම

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පාඨමාලා හදාරණ ශිෂ්‍යයන්, නියමිත කාල සීමාවක් තුළ අධ්‍යයනය කරන ලද පාඨමාලාවට අදාළ විෂය කරුණු අඛණ්ඩ ඇගයීම්, ක්‍රියාකාරකම් හා අවසාන විභාගය මඟින් ඇගයීමට භාජනය කරනු ලැබේ.

සෑම පාඨමාලාවක් සඳහාම ශිෂ්‍යයින් නියමිත පැවරුම් සංඛ්‍යාවක් ලියා, නියමිත දින වකවානු තුළ ඉදිරිපත් කර ප්‍රමාණවත් ලකුණු ප්‍රමාණයක් ලබා ගත්තේ නම්, පාඨමාලාවේ අවසාන විභාගයට පෙනී සිටීමේ සුදුසුකම් ලබයි.

එක් එක් අධ්‍යයන අංශ විසින් නියමිත දිනවල දී වැඩසටහනට අදාළ පැවරුම් සිසුන් වෙත ලබා දේ.

සාර්ථක ව නිම කරන ලද පැවරුම් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඕනෑම ප්‍රාදේශීය / අධ්‍යයන මධ්‍යස්ථානයක පැවරුම් බාර දිය යුතු ස්ථානයට නියමිත දින වකවානු තුළ පැමිණ බාර දීමට කටයුතු කිරීම ශිෂ්‍යයාගේ වගකීමක් ලෙස සැළකිය යුතුය.

සෑම ශිෂ්‍යයෙකුම තමා හදාරණ වැඩසටහනේ අවසන් විභාගයට පෙනී සිටීම සඳහා යෝග්‍යතාව ලබා ගත යුතුය. යම් හෙයකින් යෝග්‍යතාව ලබා ගැනීමට අපොහොසත් වූ ශිෂ්‍යයන් නැවත යෝග්‍යතාව ලබා ගෙන වැඩසටහන සම්පූර්ණ කළ යුතුය. මෙහිදී එම ශිෂ්‍යයන් නැවත අදාළ වැඩසටහන සඳහා ලියාපදිංචි විය යුතුය.

යම් ශිෂ්‍යයෙකු තමා හදාරණ වැඩසටහනේ අවසන් විභාගයෙන් අසමත් වුවහොත්, නැවත වරක් අවසන් විභාගයට පෙනී සිටිය යුතුය.

මෙහිදී අදාළ ශිෂ්‍යයා විසින් නැවත යෝග්‍යතාව ලබා ගැනීම අවශ්‍ය නොවන නමුත් ශිෂ්‍යභාවය පවත්වා ගත යුතුය.

## 3. ප්‍රාදේශීය මධ්‍යස්ථාන සේවා

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කටයුතු ප්‍රාදේශීය මට්ටමින්, ප්‍රාදේශීය මධ්‍යස්ථාන, අධ්‍යයන මධ්‍යස්ථාන හා ඉගැන්වීම් මධ්‍යස්ථාන වශයෙන් ව්‍යාප්ත ව පවතී.

## 3.1 ප්‍රාදේශීය මධ්‍යස්ථාන සහ අධ්‍යයන මධ්‍යස්ථාන පිහිටි ස්ථාන

***ප්‍රාදේශීය මධ්‍යස්ථාන***

| පිහිටීම | කේතය | ලිපිනය හා දුරකථන අංක |
|---|---|---|
| කොළඹ | WP10 | විවිප්‍රාම නාවල,<br>නුගේගොඩ (011- 2853930) |
| මහනුවර | CP20 | විවිප්‍රාම පොල්ගොල්ල,<br>මහනුවර (081-2494495-97) |
| මාතර | SP30 | විවිප්‍රාම නූපේ,<br>මාතර (041-2222943) |
| යාපනය | NP40 | විවිප්‍රාම බ්‍රවුන්ස් පාර, කොකුවිල්,<br>යාපනය (021-2223374) |
| අනුරාධපුරය | NC50 | විවිප්‍රාම ජයන්ති මාවත, (ඩිපෝ පෙදෙස)<br>අනුරාධපුරය (025-2222871) |
| මඩකලපුව | EP60 | විවිප්‍රාම අංක 23, අවුත් පාර,<br>මඩකලපුව (065-2222264) |
| කුරුණෑගල | NW70 | විවිඅම මීගමුව පාර, (නිස්සංක පාර හන්දිය)<br>මල්කඩුවාව, කුරුණෑගල (037-2223473) |
| බදුල්ල | UP80 | විවිඅම අංක 179, කැප්පෙටිපොල පාර<br>බදුල්ල (055-2228842) |

විවිප්‍රම - විවෘත විශ්ව විද්‍යාල ප්‍රාදේශීය මධ්‍යස්ථාන

*අධ්‍යයන මධ්‍යස්ථාන*

| **පිහිටීම** | **කේතය** | **ලිපිනය හා දුරකථන අංක** |
|---|---|---|
| අම්බලන්ගොඩ | SP31 | විවිඅම, 80/1, පොල්වත්ත පාර, හල්වතුර, අම්බලන්ගොඩ 091-2258585 |
| අම්බලන්තොට | SP33 | විවිඅම රාජාසරණගම පාර, ලුනාම දකුණ, අම්බලන්තොට 047-2225533 |
| අම්පාර | EP61 | විවිඅම ඉඟිනියාගල පාර, සාම පුර, අම්පාර 063-2222052 |
| බණ්ඩාරවෙල | UP81 | විවිඅම ශාන්ත තෝමස් පාර, වැවතැන්න, බණ්ඩාරවෙල 057-2222820 |
| ගාල්ල | SP32 | විවිඅම ලබුදූව, ගාල්ල 091-2223784 |
| ගම්පහ | WP11 | විවිඅම ගම්පහ පාර, මිරිස් වත්ත, මුදුන්ගොඩ 033-2234571 / 033-2234572 |
| හැටන් | CP21 | විවිඅම තොන්ඩමන් වෘත්තිය පුහුණු මධ්‍යස්ථානය, හැටන් 051-2225139 / 051-2223492 |
| කළුතර | WP12 | විවිඅම 66/2, නාගොඩ පාර, කළුතර 034-2223399 / 034-3949160 |
| කෑගල්ල | SG91 | විවිඅම කුමාරතුංග මුණිදාස මාවත, කෑගල්ල 035-2222501 |
| කිලිනොච්චි | NP42 | විවිඅම 155 වන කණුව, නුවර පාර, කිලිනොච්චිය 021-2283970 |
| කුලියාපිටිය | NW72 | විවිඅම කාර්මික විද්‍යාලය, කුලියාපිටිය 037-2281181 / 037-2281271 |
| මොණරාගල | UP82 | විවිඅම කාර්මික විද්‍යාලය හන්දිය, සිරිගල පොතුවිල් පාර, මොණරාගල 055-2277395 |

| | | |
|---|---|---|
| පොළොන්නරුව | NC51 | විවිඅම 24 කනුව, බැඳි වැව, ජයන්ති පුර, පොළොන්නරුව 027-2225776 |
| පුත්තලම | C135 | විවිඅම 1/137 කොළඹ පාර, පුත්තලම 032-2266822 |
| රත්නපුරය | J165 | විවිඅම හිදෙල්ලන, රත්නපුරය 045-2228660 |
| ත්‍රිකුණාමලය | EP62 | විවිඅම 26/A තැපැල් කාර්යාල පාර ත්‍රිකුණාමලය. 026-3264813 |
| වවුනියාව | NP41 | විවිඅම 366, නුවර පාර, තේක්කවත්ත, වව්නියාව. 024-2222995 |

විවිඅම - විවෘත විශ්වවිද්‍යාල අධ්‍යයන මධ්‍යස්ථාන

## 4. අධ්‍යාපන පීඨය

මෙම පීඨය පහත සඳහන් දෙපාර්තමේන්තුවලින් සමන්විත වේ.

i. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ii. ද්විතීයික හා තෘතීයික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

iii. විශේෂ අවශ්‍යතා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 4.1 මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

මෙම දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨය යටතේ ක්‍රියාත්මක වේ.

**4.1.1 මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව මඟින් මෙහෙයවන අධ්‍යයන වැඩසටහන්**

i. පෙර පාසල් අධ්‍යාපන සහතික පත්‍ර වැඩසටහන
ii. පෙර පාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන
iii. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන

## දෙවන කොටස

**5. මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන**

| | | |
|---|---|---|
| කාල සීමාව | - | අවුරුදු 02 |
| මාධ්‍යය | - | සිංහල, ඉංග්‍රීසි, දෙමළ |
| අධ්‍යයන වර්ෂය | - | 2017 / 2018 |

**5.1 වැඩසටහනෙහි පරමාර්ථ**

මෙම වැඩසටහනෙහි පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීමයි.

මෙම වැඩසටහන මඟින් අපේක්ෂිත සුවිශේෂි අරමුණු වනුයේ මෙම වැඩසටහන අනුව අධ්‍යයන කටයුතුවල යෙදෙන ප්‍රාථමික අධ්‍යපන හා මුල් ළමාවිය අධ්‍යාපන කටයුතු මෙහෙයවන

ගුරුවරුන් හා දරුවන් රැක බලා ගන්නන් ලෙස සේවය කරන්නන් තුළ

- ළමා සංවර්ධනය හා අදාළ (ආශ්‍රිත) දැනුම හා අවබෝධය වැඩි දියුණු කිරීම
- ප්‍රාථමික හා මුල් ළමාවිය සම්බන්ධ පිළිගත් න්‍යාය හා ප්‍රායෝගික කටයුතු පිළිබඳ හුරු පුරුදු වීම.
- ළමුන් සමඟ කටයුතු කිරීමේ දී ධනාත්මක ආකල්ප වර්ධනය කර ගැනීම.
- ප්‍රායෝගික කටයුතු මඟින් අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීම.
- විශේෂ අවස්ථාවලට මුහුණ දී ඇති ආයතන හා කණ්ඩායම්වල සුවිශේෂී අවශ්‍යතාවලට අදාළ අධ්‍යාපන ගැටළු පිළිබඳ සංවේදී වීම.
- තෝරාගත් අධ්‍යයන විෂයයන්ට අදාළ දැනුම් හා කුසලතා ශක්තිමත් කරවීම
- කළමනාකරණ හා සංවිධාන ශක්‍යතා වැඩි දියුණු කිරීම
- දෙමාපියන් හා ප්‍රජාව සමඟ අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමේ හැකියා සංවර්ධනය කර ගැනීම

## 5.2 ප්‍රවේශ සුදුසුකම්

මෙම අධ්‍යයන වැඩසටහනට ඇතුළු වීම සඳහා පහත සඳහන් සුදුසුකම් ලැබිය යුතු වේ.

0.1 අයදුම්පත් භාර ගන්නා දිනට වයස අවුරුදු 18 ට නොඅඩු වීම.

0.2 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වා ගෙන යන **පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතිකය** හෝ

0.3 **අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් 03 කින් සාමාර්ථය හා අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හා ගණිතය ඇතුළුව විෂයයන් 06 ක් සමත් වී තිබීම** හෝ

0.4 ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන පදනම් පාඨමාලා පළමුවන හෝ / හා දෙවන මට්ටම්වලදී ලබාගත් සම්මාන අගය අවම වශයෙන් 54 ක් වන පාඨමාලාවලින් සාමාර්ථය ලබා තිබීම, හෝ

0.5 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ මඟින් පිරිනමන ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම, **(ශ්‍රී ලංකා)**

0.6 ශ්‍රී ලංකාවේ රජයේ ගුරු පුහුණු ආයතනයකින් ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

**සටහන** මෙම වැඩසටහන **ඉංග්‍රීසි මාධ්‍යයෙන්** හැදෑරීමට නම්, අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් **සම්මාන සාමාර්ථයක්** (2001 පෙර) හෝ **B** සාමාර්ථයක් (2001 සිට) ලබා තිබිය යුතුය.

- සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන තෝරාගැනීමේ පරීක්ෂණයට **2017.11.05** දින අනිවාර්යයෙන් පෙනීසිටිය යුතුයි. පෙරපාසල් උසස් සහතිකපත්‍ර වැඩසටහනට **විශිෂ්ට සාමාර්ථයක්** හෝ **සම්මාන සාමාර්ථයක්** ලබාගත් සිසුන් පමණක් තෝරාගැනීමේ

පරීක්ෂණය නොමැතිව වැඩසටහනට ඇතුළත් වීමට සුදුසුකම් ලබයි.

- ඔබගේ අයදුම්පතේ සඳහන් කරනු ලබන මධ්‍යස්ථානයෙහිම තෝරාගැනීමේ පරීක්ෂණය සඳහා පෙනීසිටිය යුතුයි.

## 5.3 අධ්‍යයන මාධ්‍ය

වැඩසටහන හැදෑරීම සඳහා සිංහල, ඉංග්‍රීසි හෝ දෙමළ

මාධ්‍යය තෝරාගත හැකිය.

**සටහන** - ඉංග්‍රීසි මාධ්‍යය සඳහා ලියාපදිංචි වූ සිසුන් අදාල පැවරුම් වලට සහ අවසාන පරීක්ෂණයට ඉංග්‍රීසි මධ්‍යයෙන් පිළිතුරු සැපයිය යුතුය. එසේ නොවන්නේ නම් ඔබගේ එම පිළිතුරුපත් ඇගයීම් නොකරන අතර එම අදාල පැවරුම් වලට සහ අවසාන පරීක්ෂණයට නැවත මුහුණදීමට ඔබට සිදු වනු ඇත.

## 5.4 ප්‍රාදේශීය මධ්‍යස්ථාන

මෙම වැඩසටහන කොළඹ ප්‍රාදේශීය මධ්‍යස්ථාන්යේ පවත්වනු ලැබේ. **සැලකිය යුතු සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංච සිටී නම්** මහනුවර, අනුරාධපුරය, මාතර, යාපනය සහ මඩකලපුව ප්‍රාදේශීය මධ්‍යස්ථාන්හි සහ ගම්පහ, බණ්ඩාරවෙල, අම්බලන්තොට සහ හැටන් අධ්‍යයන මධ්‍යස්ථාන්හි ද පවත් වනු ලැබේ.

## 5.5 අධ්‍යයන පිළිවෙල

### *5.5.1 සම්මාන*

විශ්වවිද්‍යාලයීය පාරිභාෂික යෙදුම් අනුව, සම්මාන යනු අ.පො.ස. (සා/පෙළ) හෝ අ.පො.ස. (උ/පෙළ) හෝ වෙනත් විභාගවල හෝ සම්මාන වැනි දෙයක් යැයි වරදවා වටහා නොගත යුතුය.

යම් ශිෂ්‍යයකු තම ඉගෙනීමට ගත කළ යුතු කාලය පදනම් කරගෙන මෙම සම්මාන ක්‍රමය සකස් කර ඇත. සම්මාන දහ අටක් (18) ක් යනු යම් පාඨමාලාවක් ඉගෙනුමට, යම් ශිෂ්‍යයකු මිඩංගු කළ යුතු කාලය පැය 450 ක් ලෙස සලකා සකස් කරන ලද අගයකි. සම්මාන 01 = ඉගෙනුම් පැය 25 කි. එනිසා එක් එක් අධ්‍යයන වර්ෂයක දී ශිෂ්‍යයකුට ලියාපදිංචි විය හැකි උපරිම සම්මාන ප්‍රමාණය තිහකි (30).

මෙම අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක වන්නේ දුරස්ථ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයටයි. එක් එක් වර්ෂයේ ආරම්භයේදීම ඒ ඒ අධ්‍යයන වර්ෂයට අදාළ ඉගෙනුම් ද්‍රව්‍ය (පාඩම් පොත්) ඔබට ලබා දෙනු ඇත. ඔබට ඒවා නිවසේදීම අධ්‍යයනය කළ හැකිය.

එම මුද්‍රිත පාඩම්වලට අමතරව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාල පරිශ්‍රයේදීම සති අන්තයේ දී දින පාසල් පැවැත්වේ. ඔබට පාඩම් කියවීමේදී මතුවන යම්කිසි ඉගෙනුම් ගැටළුවක් වේ නම් එම ගැටළු මෙම දින පාසල්වල දී ඉදිරිපත් කර සාකච්ජා කර

පැහැදිලි කර ගත හැකිවේ. දින පාසල පවත්වනු ලබන්නේ මෙම ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර හෝ බාහිර හෝ කථිකාචාර්යවරුන් විසිනි. මෙම පාඨමාලාව හදාරණ සිසුන්ට මෙම දින පාසල් අතිශයෙන් ම ප්‍රයෝජන වන්නේ කරුණු දෙකක් මතය. එනම්, කථිකාචාර්යවරුන් සමඟ සම්මුඛව පාඩම් අවබෝධ කර ගැනීමට හා තමන් සමඟ එකට වැඩසටහන හදාරණ අනෙක් සිසුන් මුණ ගැසී හඳුනා ගැනීමට හැකි වීම ද වේ.

EPD4532 මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ක්ෂෙත්‍ර ප්‍රායෝගික වැඩ තෝරා ගත් පෙර පාසල්වල හා ප්‍රාථමික පාසල්වල පවත් වනු ලැබේ.

## 5.6 අධ්‍යයන වැඩසටහනේ විෂය මාලාව

මෙම වැඩසටහනෙහි විෂය මාලාව පහත සඳහන් පරිදි අධ්‍යයන වර්ෂ දෙක පුරා විහිදෙන ලෙස සංවිධානය කර ඇත.

**පළමු වසර (3 වන මට්ටම)**

වෘත්තීය පාඨමාලා - (අනිවාර්ය පාඨමාලා)

| පාඨමාලා කේතය | පාඨමාලා මාතෘකාව | සම්මාන ප්‍රමාණය |
|---|---|---|
| EPD3530 | ළමා සංවර්ධනය 1 | 5 |
| EPD3331 | මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝක | 3 |
| EPD3531 | විෂය මාලා අධ්‍යයන සහ ප්‍රායෝගික වැඩ භාෂා අධ්‍යයන - (සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි) | 5 |
| EPD3532 | විෂය මාලා අධ්‍යයන සහ ප්‍රායෝගික වැඩ - ගණිතය | 5 |

| | | |
|---|---|---|
| EPD3232 | සෞන්දර්ය හා නිර්මාණ ක්‍රියාකාරකම් | 2 |
| EPD3233 | විෂය මාලා අධ්‍යයන සහ ප්‍රායෝගික වැඩ - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | 2 |
| EPD3234 | විෂය මාලා අධ්‍යයන සහ ප්‍රායෝගික වැඩ - සෞඛ්‍යය, පෝෂණය හා ආරක්ෂාව පිළිබඳ ගතයුතු පියවර | 2 |
| EPD3335 | ප්‍රාථමික හා පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයේ සමෝධානික පිවිසුම | 3 |
| EPD3336 | මුල් ළමාවිය ආයතන හා ප්‍රාථමික පාසල් කළමනාකරණය | 3 |
| | **මුළු සම්මාන ප්‍රමාණය** | **30** |

**අඛණ්ඩ අධ්‍යයන පාඨමාලාව (3 වන මට්ටම)**

| | | |
|---|---|---|
| ESE2815 | මුල් ළමාවියේ සංවර්ධනය | 8 |

**දෙවන වසර (4 වන මට්ටම)**

වෘත්තිය පාඨමාලා (අනිවාර්ය පාඨමාලා)

| **පාඨමාලා කේතය** | **පාඨමාලා මාතෘකාව** | **සම්මාන ප්‍රමාණය** |
|---|---|---|
| EPD4530 | ළමා සංවර්ධනය II | 5 |
| EPD4531 | ඉගැන්වීම්/ඉගෙනුම් පර්යාලෝක | 5 |
| EPD4532 | මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ක්ෂෙත්‍ර ප්‍රායෝගික වැඩ | 5 |
| EPD4533<br>EPD4534 | ප්‍රාථමික මට්ටමේ සිංහල භාෂාව ඉගැන්වීම<br>**නැතහොත්**<br>දෙමළ භාෂාව ඉගැන්වීම | 5 |
| EPD4535 | පෞරුෂ මනෝ විද්‍යාව | 5 |
| EPD4536 | සමාජ මනෝ විද්‍යාව | 5 |

| | | |
|---|---|---|
| | **මුළු සම්මාන ප්‍රමාණය** | **30** |

**අඛණ්ඩ අධ්‍යයන පාඨමාලාව (4 වන මට්ටම)**

| | | |
|---|---|---|
| EPE2517 | පෙර ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික සාධන | 5 |

## 5.7 පූර්ව අවශ්‍යතා

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන සම්පූර්ණ කර නොමැති නම්,

- EPE2815 මුල් ළමා වියෙහි සංවර්ධනය පාඨමාලාව සඳහා 3 වන මට්ටමේදී ද
- EPE2517 මුල් ළමාවියේ අධ්‍යාපනය පිළිබඳ සමාජ-සංස්කෘතික සාධක පාඨමාලාව සඳහා 4 වන මට්ටමේදී ද අඛණ්ඩ අධ්‍යයන පාඨමාලා ලෙස ලියාපදිංචි විය යුතුය.

ඉහත EPE2815 සහ EPE2517 යන අඛණ්ඩ පාඨමාලා දෙක සඳහා අවම වශයෙන් C සාමාර්ථයන් ලබා ගත යුතු වේ.

## 5.8 පාඨමාලාවලින් නිදහස් කිරීම

වෘත්තීය පාඨමාලා සම්බන්ධයෙන් උපරිම වශයෙන් 3 වන මට්ටමේදී සම්මාන අගය 9 ක් ද, හතරවන මට්ටමේදී සම්මාන අගය 6 ක් ද, නිදහස් කිරීමක් පුහුණු ගුරු සහතිකය (රජයේ ගුරු පුහුණු විද්‍යාල) හෝ ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමාව (අධ්‍යාපන විද්‍යා පීඨ) සමත් අයදුම්කරුවන්ට ලබා ගත හැකිය.

## 5.9 ඇගයීම් ක්‍රියාවලිය

ඇගයීම ක්‍රම දෙකකින් සිදුවේ

(i) අඛණ්ඩ ඇගයීම

(ii) අවසාන ඇගයීම වශයෙනි

අඛණ්ඩ ඇගයීම් පැවරුම් මඟින් සිදු කෙරේ. ඒ ඒ පාඨමාලා සඳහා ඉදිරිපත් කළ යුතු පැවරුම් සංඛ්‍යාව පාඨමාලා අත් පොතෙහි දක්වා ඇත. එම අත්පොත ඔබට ලියාපදිංචි වන දිනයේ දි ලැබෙනු ඇත.

සියලුම පැවරුම් අනිවාර්ය වේ. පැවරුම් සඳහා ප්‍රදානය කරනු ලබන ලකුණු ප්‍රමාණයෙන් යම් කිසි ප්‍රතිශතයක් අවසාන ලිඛිත පරීක්ෂණ ලකුණට එකතු කර, අවසාන ලකුණ තීරණය කරනු ලැබේ.

අනුයුක්ත කරනු ලබන පෙර පාසලක සහ පාසලක ප්‍රාථමික අංශයක සිදු කරනු ලබන ප්‍රායෝගික ඉගැන්වීම් මෙම වැඩසටහනේ අවසාන පරීක්ෂණයේ අනිවාර්ය අංගයකි.

***වැදගත්***

***සියළුම අයදුම්කරුවන්ට ප්‍රායෝගික ගුරු පුහුණුව සඳහා සහභාගි වීමට අවශ්‍ය නිවාඩු ලබා දෙන බවට සහතික කරමින් ආයතන ප්‍රධනියා වෙතින් ලිපියක් ලියාපදිංචි වන අවස්ථාවේ දි ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.***

## 5.10 සහතික ප්‍රදානය

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන විධිවිධානවලට අනුකූලව මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ලැබේ.**

**මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පිළිබඳ ඩිප්ලෝමාව ප්‍රදානය කරනුයේ ඉහත දක්වා ඇති සියලුම පාඨමාලා සඳහා සමත් ලකුණු (C සාමාර්ථ) ලබා ගත හොත් පමණි. අඛණ්ඩ අධ්‍යාපන පාඨමාලා සඳහා ද ( EPE2815 සහ EPE25) අනිවාර්යයෙන්ම C සාමාර්ථ ලබා ගත යුතුවේ.**

## 5.11 ලියාපදිංචිය / ගෙවීම්

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කොළඹ මධ්‍යස්ථානයේ පමණක් ශිෂ්‍යයන් ලියාපදිංචි කරනු ලැබේ.

ලියාපදිංචිවීම සිදු කළ අවසාන දිනයේ සිට **මාසයක් ඇතුළත** ලියාපදිංචි වූ ශිෂ්‍යයකුට පාඨමාලා වෙනස් කිරීම සඳහා හෝ ඉගෙනුම ලබන මාධ්‍ය වෙනස් කිරීම සඳහා හෝ වෙනත් පාඨමාලා හැදෑරීම සඳහා හෝ අවසරදිය හැකිය.

වැඩසටහනට ලියාපදිංචි වීමේදී සහ ගාස්තු නියම කරනු ලබන සෑම අවස්ථාවකදීම, ඒවා අප්‍රමාදව ගෙවීමට කටයුතු කළ යුතුය. ගාස්තු ගෙවිය යුතු ක්‍රමය වවුචරවල දක්වා ඇත.

යම්කිසි වැඩසටහනකට ලියාපදිංචි වීම සඳහා නියමිත අවසාන දිනයෙන් පසුව කිසිම හේතුවක් නිසා කෙනෙකුට වැඩසටහනට ලියාපදිංචි විය නොහැක.

## 5.12 ගාස්තු

2017 / 2018 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු හා ශිෂ්‍යෝපදේශන ගාස්තු පහත සඳහන් පරිදි වේ.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වා ගෙන යන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතිකය **සහිත** අයදුම්කරුවන් සඳහා

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | රු. | 400.00 |
| පහසුකම් ගාස්තු | රු. | 1500.00 |
| ශිෂ්‍යෝපදේශන ගාස්තු (මට්ටම 3 සහ 4) | රු. | 72000.00 |
| මුළු ගාස්තු | රු. | 73900.00 |

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මඟින් පවත්වා ගෙන යන පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතිකය **රහිත** අයදුම්කරුවන් සඳහා

| | | |
|---|---|---|
| ලියාපදිංචි ගාස්තු | රු. | 400.00 |
| පහසුකම් ගාස්තු | රු. | 1500.00 |
| ශිෂ්‍යෝපදේශන ගාස්තු (මට්ටම 3 සහ 4) | රු. | 83700.00 |
| මුළු ගාස්තු | රු. | 85600.00 |

**ගාස්තු වාරික හතරකින් ගෙවීම් කළ හැකිය.**

## 5.13 වැඩසටහන ආරම්භය

2017 / 2018 **මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන 2018 මාර්තු** මාසයේ දි ආරම්භ කිරීමට නියමිතය.

## 14.0 My OUSL

ඔබට දැන් විවෘත විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් වෙනුවෙන් ඇති My OUSL පහසුකම වෙත පහත සඳහන්

URL:http://myousl.ou.ac.lk/

ලිපිනය භාවිත කර පිවිසිය හැක. එමෙන්ම

http://www.ou.ac.lk/

මගින් විවෘත විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුව තුළින් ද එයට පිවිසිය හැක. ඒ සඳහා ඔබගේ ශිෂ්‍ය වාර්තා පොතේ පුද්ගලික තොරතුරු පිටුවේ සඳහන් පරිදි

User Name: [Student ID]

Password : [National ID number]

වශයෙන් භාවිත කරන්න.

පළමු පිවිසුමේදීම ඔබගේ තොරතුරු ආරක්ෂා කර ගැනීම සඳහා Password වෙනස් කර ගැනීමට අමතක නොකරන්න.

## 15.0 අයදුම්පත් සහ ලියාපදිංචිය

අධ්‍යාපන පීඨය මගින් පිරිනමනු ලබන මෙම උපාධි වැඩසටහනට online ආකාරයට අයදුම් කළ යුතුය.ඇමුණුම අංක 1 දී ඇති උපදෙස් වලට අනුකූලව එම online අයදුම්පත පිරවීමට සැලකිලිමත් වන්න.

**ලියාපදිංචිය සඳහා අවශ්‍ය ලියකියවිලි**

1- ජාතික හැඳුනුම්පත සහ එහි ඡායා පිටපතක්

2- උප්පැන්න සහතිකය සහ එහි ඡායා පිටපතක්

3- Passport ප්‍රමාණයේ ඡායාරූප 03 (මිමි35 x මිමි45)

4- ගෙවන ලද වව්චර් පතේ විශ්ව විද්‍යාල පිටපත

## 16.0 වැදගත් දින

තෝරාගැනීමේ පරීක්ෂණය - 05.11.2017

ලියාපදිංචිය/නැවත ලියාපදිංචිය - 24.02.2018, 27.02.2018

පසු ලියාපදිංචිය - 17.03.2018

අධ්‍යයන කටයුතු ආරම්භය - 2018 මාර්තු මස සිට

ලියාපදිංචි පාඨමාලා ඉවත්කර ගැනීමේ සහ අළුතින් එකතුකර ගැනීමේ කාලසීමාව - 02.02.2018

**ඇමුණුම 1**

**Online අයදුම්පත් සඳහා උපදෙස්**

2017/2018 ඩිප්ලෝමා වැඩසටහන් සඳහා අයදුම්පත් භාර දිය හැක්කේ Online ආකාරයටය. පළමුව ඔබ කළ යුත්තේ Online වලට ප්‍රවේශවීම සඳහා Online Login Account එකක් නිර්මාණය කර ගැනීමයි. ඔබගේ අයදුම් පත්‍රය Online ආකාරයට භාර දීම සම්බන්ධව ඉදිරි වැඩකටයුතු කළ හැක්කේ ඉන් අනතුරුවය.

1. අන්තර්ජාලය තුල www.ou.ac.lk ලෙස type කරන්න.

2. Online Login Account එකක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ ප්‍රධාන වෙබ් පිටුවේ ඇති 'online application' මත click කරන්න.

   අළුත් account එකක් නිර්මාණය කර ගනිමින් එක වර ලියාපදිංචිය ලබා ගන්න. මෙය කිරීම සඳහා ලබා දී ඇති උපදෙස් වලට අනුකූලව 'create new account' මත click කරන්න.

   **<u>සැලකිය යුතුය</u>**

   අවශ්‍යයෙන්ම සම්පූර්ණ කල යුතුය යැයි පෙන්වා දී ඇති තැන්වල ඔබගේ හෝ පවුලේ සාමාජිකයෙකු හෝ මිත්‍රයෙකුගේ ලිපිනය සහ ජංගම දුරකථන අංකය සඳහන් කිරීමට සැලකිලිමත් වන්න.

   ඔබගේ අයදුම්පත්‍රයෙහි රිසිට් පත පිළිබඳව දැනුම් දීම සඳහා අවශ්‍ය වු විට අමතර තොරතුරු ලබා දීම සඳහා විශ්වවිද්‍යාලය මින් ඉදිරියට භාවිත කරනු ලබන්නේ එම විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකථනයයි.

3. ඔබගේ online account එක නිර්මාණය කර ගත් පසු ඔබගේ අයදුම්පත්‍ර භාර දීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු කළ හැක. මේ සඳහා 'online application' වෙත ගොස් ඔබගේ user name සහ password type කරන්න. අනතුරුව online application form එක පුරවන්න. එය පුරවා අවසානයේ submit කරන්න.

**<u>සැලකිය යුතුය</u>**

**ඔබ ගෙවීම් කරන ක්‍රමය තෝරාගෙන ලබා දී ඇති උපදෙස් අනුව ඊට අදාළ තොරතුරු පුරවන්න. අයදුම්පත්‍ර සඳහා අයකරනු ලබන්නේ රු.600/- පමණි. මෙය ඔබට ඔබගේ credit හෝ debit card මගින් ගෙවිය හැකිය. credit සහ debit card නොමැති අයදුම්කරුවන්ට අදාළ ගෙවීම් මුදල් වලින් ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථාන මගින් කළ හැක.**

online applitcation එක පිරවීම සඳහා සහයක් අවශ්‍ය අයදුම්කරුවන්ට ඕනෑම ප්‍රාදේශීය හෝ අධ්‍යයන මධ්‍යස්ථානයක් මගින් අවශ්‍ය සහය ලබා ගත හැක. ඒ සඳහා පහත තොරතුරු ලබා දිය යුතුය. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය ලිපිනය ජංගම දුරකථන අංකය අ.පො.ස (උ.පෙළ) ප්‍රතිඵල සටහන.

P වචැබාසං - 1

## Sample Online Application form



# Online Application

### Please fill the Application

**Personal Details**

| | |
|---|---|
| Title | Mr. |
| Initial | |
| LastName | |
| Name Denoted by Initials | |
| Address line 1 | |
| Address line 2 | |
| Address line 3 | |
| NIC/Passport No | |
| Date of Birth | |
| E mail | |
| Telephone -Mobile | |
| Telephone -Fixed | |
| Country | Sri Lanka |

**Programe Details**

| | |
|---|---|
| Programe | Please select |
| Prefferd Center | Please select |
| Programme Medium | Please select |
| Selection Test Medium | Please select |

Appl Now | Reset